# අපට එරෙහි වූ බහුසංස්කෘතික කෙප්පය

පසුගිය සතියෙහි පළ වූ ලිපියෙහි මාතෘකාවෙහි මෙන් ම අන්තර්ගතයෙහි ද මුද්‍රණ දෝශයක් වෙයි. බහුජාතක යන්න එහි සඳහන් වී තිබුණේ බහුජාතික ලෙස ය. බහුසංස්කෘතික සංකල්පය හෙවත් කෙප්පය කිහිපදෙනකුගේ සහභාගීත්වයෙන් බිහි වූවකි. වෙනත් වචනවලින් කියන්නේ නම් ඒ සංකල්පය නිර්මාණය කිරීමෙහි ලා කිහිපදෙනකු සහභාගි වී ඇත. එබැවින් සංකල්පය කිහිපදෙනකුට ජාතක වී ඇතැයි අපට කිවහැකි ය. ඒ අර්ථයෙන් බහුසංස්කෘතික යන්න බහුජාතක කෙප්පයක් වෙයි. මේ සංකල්පය බටහිර රටවල දුර්වල අර්ථයකින් ද අපේ රටවල ශක්තිමත් අර්ථයකින් ද ක්‍රියාත්මක වෙයි. බටහිර දී ඒ සංකල්පයෙන් කියැවෙන්නේ රටක විවිධ සංස්කෘතීන් ඇති බව ය. අපේ රටවල එයට අමතරව විවිධ සංස්කෘතීන් සම තත්වයෙහි ලා සැලකෙයි. බහුසංස්කෘතික සංකල්පය දුර්වල අර්ථයකින් පවා වර්තමානයෙහි දී අර්බුදයකට මුහුණ පා ප්‍රතික්ෂෙප වීමට යන්නේ බ්‍රිතානියෙහි පමණක් නො වෙයි. අද විවිධ ජනවර්ග, විශේෂයෙන් ම මුස්ලිම් ජනයා, වාසයකරන බටහිර සෑම රටකම පාහේ බහුසංස්කෘතික යන්න ගර්හිත සංකල්පයක් බවට පත්වීමෙහි ප්‍රවනතාවක් ඇත. ඒ අතර රටක හර සංස්කෘතිය (කෝර් කල්චර්) යන සංකල්පය කරළියට පැමින ඇත. බටහිර රටවල සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි වීමට පටන්ගත්තේ දැනට අවුරුදු පන්සීයකට පමණ පෙර ය. ඉන් පෙර බටහිර යුරෝපීය රටවල කතෝලික සංස්කෘතිය ද, නැගෙනහිර යුරෝපීය රටවල ග්‍රීක ඕතොඩොක්ස් සංස්කෘතිය ද විය. සංස්කෘතියකට ආගමික පසුබිමක් ඇතිමුත් රටක සංස්කෘතිය සෑම විට ම බහුතර ජනතාව අදහන ආගම පසුබිම්කරගත යුතු නො වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් අද ද බටහිර යුරෝපයෙහි ප්‍රංශය, ඉතාලිය වැනි ආගමින් කතෝලික රටවල් වෙයි. එහෙත් ඒ රටවල පවා සංස්කෘතිය වර්තමානයෙහි දී යුදෙව් ක්‍රිස්තියානි බවට පත් වී ඇත. අවුරුදු පන්සියයකට පමණ පෙර යුරෝපයෙන් බිහි වූ පළමු යටත්විජිතවාදීහු, පෘතුගීසීහු හා ස්පාඤ්ඤයෝ වූහ. ඔවුහු ආගමින් කතෝලික වූහ. එහෙත් ඔවුන් යටත්විජිතකරණයෙහි යෙදුණේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පුරෝගාමීන් ලෙස ය. කතෝලික රටක් වූ ඉතාලියෙහි කොපර්නිකස් පඬිවරයා කතෝලික පූජකවරයකු වීමට ඉගෙනගත් අතර ගැලීලියෝ විද්වතා ජීවත්විය. ඒ දෙදෙනා ම මියයන තුරු ම කතෝලිකයන් වූ නමුදු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ආරම්භකයෝ වූහ. ඒ අතර ඒ සියල්ලෝ ම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පුරෝගාමීහු ද වූහ. මාටින් ලූතර් පූජකතුමා ආදීහු ඒ නව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අදාළ ව ආගමක්, එනම් ප්‍රොතෙස්තන්ත ආගම නිර්මාණය කළහ. මේ ආගමේ විවිධ පැතිකඩ ප්‍රොතෙස්තන්ත, රෙපරමාදු, ඇංග්ලිකන්, මෙතෝදිස්ත ආදී වශයෙන් බටහිර යුරෝපයෙහි පැතිරී ඇත. ප්‍රංශය ආදී රටවල ආගම තවදුරටත් කතෝලික වන නමුත් ඒ රටවල ද සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි වෙයි. ප්‍රංශ විප්ලවය ගැන සඳහන්කරමින් කාල් මාක්ස් මහතා කියා ඇත්තේ ප්‍රංශයන් ඉංගිරිසින් මෙන් නොව යමක් පරිපූර්ණත්වයට ම ගෙන යන බව ය. ඒ මහතා එහි දී පෙන්නුම් කර ඇත්තේ ඉංගිරිසින් යුරෝපීය වැඩවසම් ක්‍රමයෙන් ධනේශ්වර ක්‍රමයට මාරුවීමේ දී රජපවුල ආදී ආයතන තබාගත් බවත් එහෙත් ප්‍රංශයන් රජපවුල ආදී වැඩවසම් සංස්ථා නැතිකර රාජාණ්ඩුව වෙනුවට සමූහාණ්ඩුවක් බිහිකරගත් බවත් ය. එහෙත් සංස්කෘතිය සමාජව්‍යුහයෙහි උඩුමහළට (උපරිව්‍යුහයට) තල්ලුකර දැමූ මාක්ස් මහතාට ප්‍රංශයන් ප්‍රංශ විප්ලවයත් සමග සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානි වූ නමුත්, රාජාණ්ඩුව වෙනුවට සමූහාණ්ඩුවක් බිහිකළ නමුත්, කතෝලික ආගම තවදුරටත් පවත්වාගෙන යෑමට ක්‍රියාකළ බව කීමට නො හැකි විය.

බටහිර යුරෝපීයයෝ තම රටවල හා තමන් ජනපද ඇතිකළ උතුරු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය ආදී රටවල පමණක් නොව ලෝකයේ අනෙක් රටවල ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පැතිරවීමට කටයුතු කළහ. එසේ අන්‍යයන් මත තම සංස්කෘතිය පැටවීමට කටයුතුකිරීම ද, ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් යුදෙව් චින්තනයෙන් උරුමකරගනු ලැබූවකි. යුදෙව් චින්තනයෙහි මේ ලක්ෂණය පරණ තෙස්තමේන්තුවේ සඳහන් දැයින් පෙන්නුම්කර දිය හැකි ය. තම රටවල ද අනෙක් රටවල ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ස්ථාපිත කිරීමෙහි දී හා පැතිරවීමෙහි දී බටහිර යුරෝපීයයෝ අනෙක් සංස්කෘතීන්ට කිසිම ඉඩක් නොදුන්හ. ඔවුන් යම් ආකාරයකට හෝ ඉඩක් දුන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියට විය හැකි ය. ඒ ඇත්තට ම ඉඩක් දුන්නාට වඩා ඉඩක් දීමට සිදුවීමක් විය. බ්‍රිතානීන් සිංහලයන් සමග 1815 දී අත්සන්කරන ලද ගිවිසුමෙහි කොන්දේසි දෙකක් මගින් ඒ ඉඩකඩ දීමට බ්‍රිතානීන්ට සිදුවිය. සිංහල නීතිය අනුව රටකරවීමටත් බුදුදහම රැකීමටත් පොරොන්දුවීමට ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය පැතිරවීමට පැමිණි බ්‍රිතානීන්ට සිදුවිය. ඒ සුළුපටු ක්‍රියාවක් නො වෙයි. ඒ ගිවිසුම බ්‍රිතානි පාර්ලිමේන්තුවේ තදබල විවේචනයට ලක්විය. කෙසේවෙතත් බ්‍රිතානීහු වැඩිකල් නොහොස් ම ගිවිසුම කැඩූහ. ඉන්පසු

© Prof. Nalin De Silva

මෙරට ද ඇතිවූයේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිකාධිපත්‍යයකි. දහනවවැනි සියවසෙහි අග ඇති වූ බෞද්ධ ප්‍රබෝධය යනු අන්කිසිවක් නොව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිකාධිපත්‍යයට එරෙහිව ඇතිවූ යටත්විජිතවිරෝධී අරගලයක ප්‍රතිඵලයකි. ඔල්කට්තුමාගෙන් පසුව එහි සිංහලකම අඩු වී බෞද්ධකම ඉස්මතුවීම පිළිබඳ ව අපි සාකච්ඡාකර ඇත්තෙමු.

කතෝලික සංස්කෘතිය ද ඇතුළු අනෙක් සංස්කෘතීන් ලෙයින් යටපත්කර තම තමන්ගේ රටවල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිකාධිපත්‍යය පිහිටුවීමෙන් පසුව අනෙක් සංස්කෘතීන්ගෙන් තම සංස්කෘතියට තර්ජනයක් නොමැති යැයි සිතූ බටහිරයෝ ඒ සංස්කෘතීන්ට තම රටවල සීමිත ඉඩක් ලබාදුන්හ. බටහිරයන් එලෙස ඉඩ ලබාදීමේ දී එතෙක් බොහෝවිට සිදුවී තිබූ ආකාරයට රටකින් තවත් රටකට යන සුළු පිරිසක් තම සංස්කෘතියෙන් යමක් ලබා දී හෝ නොදී හෝ ඒ දෙවැනි රටෙහි සංස්කෘතියෙහි ගිලී යෑම ද සලකන්නට ඇත. එහෙත් බටහිර නූතනත්ව ක්‍රිස්තියානි යටත්විජිතවාදය ඇතැම්විට යම් ප්‍රමාණයකට ඒ යටත්විජිතවාදයට ම එරෙහිව ක්‍රියාත්මක වෙයි. ලොවෙහි සී සී කඩ ව විසිරී ගිය ද යුදෙව්වෝ තම සංස්කෘතිය අත් නොහළහ. එමෙන් ම යුදෙව්වන් සමග පොදු මූලයක් ඇති මුස්ලිම් ජනයා ද කොතැනක සිටිය ද තම සංස්කෘතිකාංග අත්නොහරිති. අනෙක් ජනවර්ග හා ජාතීන්ට ද බටහිර යටත්විජිතවාදය ඔස්සේ මේ ලක්‍ෂණය යම් ප්‍රමාණයකට හෝ පැතිරී ගොස් ඇත. එසේ පැතිරීයෑමට බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් පිටිවහලක් ලැබීම එක්තරා අයුරකින් ගතහොත් පරස්පරයක් ලෙස සැලකිය හැකි ය. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය අනෙක් සංස්කෘතීන් නැතිකිරීමට මාන බලයි. එහෙත් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය තවත් පැත්තකින් ඒ ඒ සංස්කෘතීන් ආගන්තුක රටවල පවත්වාගෙන යෑම සඳහාත් සවිඥානික ව නොවුවත් ආධාරකරයි. එයට හේතු වී ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ගමනාගමන හා සන්නිවේදන පහසුකම් ය. අපි උදාහරණයක් ගනිමු. ලංකාවෙන් ගෙනයන සිංහල සංගීත ශිල්පියකුගේ හෝ ශිල්පිනියකගේ හෝ සංගීත ප්‍රසංග අද එංගලන්තයේ පැවැත්වෙයි. ඒවාට සහභාගිවන්නෝ ඉංගිරිසිහු නො වෙති. එවැනි සංගීත ප්‍රසංග, එංගලන්තයේ ඇති සිංහල පන්සල්වල පින්කම් ආදියට සහභාගිවන්නෝ සිංහලයෝ ය. අද එංගලන්තයට යන සිංහලයන්ට ද තමන්ගේ ඇතැම් සංස්කෘතිකාංග පවත්වාගෙන යෑමට පහසුකම් ලැබී ඇත. අවශ්‍ය නම් සිංහලයකුට එංගලන්තයේ දී ලංකාවේ මෙන් සිංහලයකු, සිංහල බෞද්ධයකු, ලෙස ජීවත්වීමේ පහසුකම් අද ලැබී ඇත. සිංහලයන්ට අද එංගලන්තයේ සිංහලයන් ලෙස ජීවත්වීමේ පහසුකම් ලැබී ඇතත් පරම්පරාවක් දෙකක් යනවිට ඔවුහු ආගමින් කෙසේ වෙතත් සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානිහු වෙති. අද ලංකාවේ ද ඇතැම්හු ආගමින් (ඔල්කට්) බෞද්ධයන් වුව ද සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානිහු වෙති. සිංහලයන්ට ද අද එංගලන්තයේ සිංහලයන් මෙන් සංස්කෘතිව ජීවත්විය හැකි නම් එහි වසන මුස්ලිම් ජනයා ගැන කියනුම කවරේ ද? නවසීලන්තය හා ඕස්ට්‍රේලියාව ද ඇතුළත් බටහිර රටවලට අද ඒ රටවල ජීවත්වන මුස්ලිම් ජනයාගේ චර්යාව තර්ජනයක් වෙමින් පවතියි. මුස්ලිම් ජනයාගෙන් විශාල ප්‍රමාණයක් හැකිතාක් දුරට මුස්ලිම් සංස්කෘතියට අනුව ජීවත්වීමට උත්සාහකිරීම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ අයට තර්ජනයක් වෙයි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ තවදුරටත් මුස්ලිම් ජනයාට තම අනන්‍යතාව පවත්වාගෙන යෑමට ඉඩදීමට බටහිර රටවල් ප්‍රතික්‍ෂෙපකිරීම ය.

ඉතිහාසයක් හා සංස්කෘතියක් ඇති යම් රටකට වෙනත් රටකින් පැමිණෙන ජනයාට රටේ සංස්කෘතිය තුළ නොගිලී තමන්ගේ සංස්කෘතීන් යම් ප්‍රමාණයකට පවත්වාගෙන යෑමට පහසුකම් ලබාදීම බහුසංස්කෘතික කෙප්පය පසුපස වෙයි. එහි දී ඒ විවිධ සංස්කෘතීන් රටේ පැවති සංස්කෘතිය හා සම තත්ත්වයේ සැලකීමක් බටහිර රටවල කිසිදිනෙක ක්‍රියාත්මක නොවූ නමුත් බහුසංස්කෘතික කෙප්පය අප වැනි රටවල යොදාගැනීමේ දී එවැනි සමානත්වයක් ද දීමට බටහිර උගත්තු තම සංකල්ප ඔස්සේ ක්‍රියාකළහ. එංගලන්තයේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා එහි ආගම වූ ඇංග්ලිකන් ක්‍රිස්තියානිය සෑමවිට ම අනෙක් සංස්කෘතීන්ට හා ආගම්වලට ඉහළින් විය. එහෙත් ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතිය අනෙක් සංස්කෘතීන් හා සම තත්ත්වයෙහි ද, බුද්ධාගම අනෙක් ආගම් සමග සම තත්ත්වයෙහි ද ලා සැලකීමට පියවර ගැණිනි. ව්‍යවස්ථාවෙහි බුද්ධාගමට දී ඇති තත්වය බහුසංස්කෘතික කේප්පයන්ගේ ප්‍රශ්නකිරීමට ලක්වෙයි. අද බටහිරයන්ට තම රටවල අර සීමිත පහසුකමවත් ලබාදීමට නොහැකි වී ඇත්තේ ඔවුන් බලාපොරොත්තු නොවූ අයුරින් අනෙක් සංස්කෘතීන් තම සංස්කෘතියට තර්ජනයක් වීම නිසා ය. අද ඔවුහු හර සංස්කෘතියක් ගැන කතාකරමින් තම සංස්කෘතියට හිමි තැන රුකගනිති. එහෙත් ඔවුන් දෙමළ ජාතිවාදය යොදාගනිමින් බහුසංස්කෘතික කෙප්පය ඔස්සේ අපට කියන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමි තැන අහිමිකරන ලෙස ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva